(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 4.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 ජනවාරි 09 වැනි බ්‍රහස්පතින්දා පූ.හා. 10.30 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.හා. 10.30 සිට අ.හා. 12.30 දක්වා ද, අ.හා. 1.30 සිට අ.හා. 6.30 දක්වා ද විය යුතු ය. අ.හා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා අ.හා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

### ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු දි. මු. ජයරත්න මහතා, හිටපු අග්‍රාමාත්‍ය සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.